Agaram.LK - Keep your dreams alive!

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය

6 ශ්‍රේණිය | නර්තනය | ඒකකය: 9- සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ

- **හරි නම් (✔) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන තුළ යොදන්න.**

01) සමූහ වාදන අංගයක දී විකල්ප වාද්‍ය භාණ්ඩ ද යොදා ගත හැකිය. ( )

02) වැසි අවස්ථාවක දී අසන්නට ලැබෙන විවිධ ශබ්ද සාම්ප්‍රදායික හා විකල්ප වාද්‍ය භාණ්ඩ මගින් නිපදවිය නොහැක. ( )

03) පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ඇඳුම් කට්ටලය පබළු ඇඳුම් කට්ටලය වේ. ( )

04) තාල පුහුණුවේ දී සාම්ප්‍රදායික හා විකල්ප භාණ්ඩ ද යොදා ගත හැකිය. ( )

- **ප්‍රශ්න අංක 05 සිට 11 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

05) සාම්ප්‍රදායික භාණ්ඩ වෙනුවට යොදා ගනු ලබන ශබ්ද හා නාද ඉපදවිය හැකි වෙනත් ආදේශක හඳුන්වන්නේ කුමන නමින් ද?

1) අවනද්ධ භාණ්ඩ   2) විකල්ප වාද්‍ය උපකරණ
3) පංචතූර්ය භාණ්ඩ   4) තූර්ය භාණ්ඩ

06) නර්තනයේ දී තාල තැබීම සඳහා යොදා ගන්නා සාම්ප්‍රදායික තාල වාද්‍ය භාණ්ඩය වන්නේ,

1) තම්මැට්ටමයි.   2) සිම්බල් එකයි.
3) පන්තේරුවයි.   4) තාලම්පටයි.

07) තම්මැට්ටමටම සවි කරනු ලබන විකල්ප වාද්‍ය භාණ්ඩය කුමක් ද?

1) දඬු බෙරය   2) ටින් බෙරය
3) ටින් පියන් තාලම්පට   4) ටොනික් මූඩි පන්තේරුව

08) පහතරට බෙරය හඳුන්වන තවත් නම් කීපයකි.

1) මඟුල් බෙරය, දික් බෙරය, ගැට බෙරය
2) සෝෂක බෙරය, දඬු බෙරය, කිඳුරු බෙරය
3) දෙවොල් බෙරය, යක් බෙරය, රුහුණු බෙරය
4) පනා බෙරය, දෙපස සම බෙරය, අණ බෙරය

09) දේශීය බෙර නිර්මාණය සඳහා අමුද්‍රව්‍ය ලෙස බහුලව යොදා ගන්නේ,

1) දැව සහ ලෝහ   2) දැව සහ සම් වර්ග
3) දැව සහ ප්ලාස්ටික්   4) ෆයිබර් සහ සම් වර්ග



agaram.lk

10) ගස්ලබු බටනලාව, ගොප්කොළ නලාව, ටින් බෙරය

1) අවනද්ධ භාණ්ඩ වේ. 2) තූර්ය භාණ්ඩ වේ.

3) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ වේ. 4) විකල්ප වාද්‍ය උපකරණ වේ.

11) තේමාවකට අනුව වාදනයක් නිර්මාණය කිරීමේ දී,

1) නාදය පමණක් යොදා ගනී.

2) ශබ්දය පමණක් යොදා ගනී.

3) ශබ්ද සහ නාද උපයෝගී කර ගනී.

4) ශබ්දයෙන් නාදය වෙන්කර ගනී.

- **කෙටි පිළිතුරු සපයන්න.**

12) විකල්ප වාද්‍ය භාණ්ඩ 03 ක් නම් කරන්න.

13) තාලය තැබීමට යොදා ගන්නා සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩය කුමක් ද?

14) පිඹීමෙන් වාදනය කරන සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 02 ක් නම් කරන්න.

15) එක් විකල්ප භාණ්ඩයක් නිර්මාණය කර ගන්නා ආකාරය කෙටියෙන් ලියන්න.

16) වැස්ස තේමා කොට ගත් සමූහ වාදනයක් නිර්මාණය කිරීමේ දී ඊට යොදා ගත හැකි වැස්සෙහි අවස්ථා පිළිවෙලින් පෙළගස්වන්න.

17) සමූහ වාදනයක් මගින් ඉදිරිපත් කළ හැකි තේමාවන් 02 ක් ලියන්න.

18) විකල්ප වාද්‍ය භාණ්ඩ 03 ක රූප සටහන් ඇඳ නම් කරන්න.

19) සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ 03 ක රූප සටහන් ඇඳ නම් කරන්න.

**සැකසුම : නවමල් ජයවීර මයා**

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk